# සිලෝන් පෙට්‍රෝලියම් ස්ටෝරේජ් ටර්මිනල්ස් ලිමිටඩ් (CPSTL)

## නිමාව කොලොන්නාව

## ඉවතලන ලිපිගොනු, කඩදාසි, පත්තර, පොලිතින්, ප්ලාස්ටික්, කාඩ්බෝඩ්, විදුරු සහ විදුරු බෝතල් අලෙවි කිරීම සඳහා ලංසු පත්‍රිකාව 2026

## KPR/16A/2025


**කළමණාකාර ප්‍රසම්පාදන,**
**ප්‍රසම්පාදන කාර්යාලයය,**
**සිලෝන් පෙට්‍රෝලියම් ස්ටෝරේජ් ටර්මිනල්ස් ලිමිටඩ්,**
**පළමු මහල, නව ගොඩනැගිල්ල,**
**කොලොන්නාව,**
**වැල්ලම්පිටිය.**

**දුරකථන අංකය:** : 011 2572155
**ෆැක්ස්** : 011 2572156
**ඊ මේල්** : : **procure@cpstl.lk**

**<u>ටෙන්ඩර් දැන්වීමයි.</u>**

සිලෝන් පෙට්‍රෝලියම් ස්ටෝරේජ් ටර්මිනල්ස් ලිමිටඩ් (CPSTL)

**පාවිච්චියෙන් පසු ඉවතලන ලිපිගොනු, කඩදාසි, පත්තර, පොලිතින්, ප්ලාස්ටික්, කාඩ්බෝඩ්, වීදුරු සහ වීදුරු බෝතල් ආදිය අලෙවි කිරීම සඳහා ලංසු කැඳවීමයි. 2026**

**(ටෙන්ඩර් අංකය KPR/16A/2025)**

| විකුණම් භාණ්ඩවල විස්තරය | ආපසු නොගෙවන ටෙන්ඩර් ගාස්තුව | ටෙන්ඩර් ලේඛණ ලබාගත හැකි කාල සීමාව | ටෙන්ඩර් වලංගු කාලය | ටෙන්ඩර් ඇපකරය සහ වලංගු කාලය | ටෙන්ඩර් විවෘත කරන දිනය හා වේලාව | භාණ්ඩ පරීක්‍ෂා කිරීම සඳහා |
|---|---|---|---|---|---|---|
| කොලොන්නාව සහ මුතුරාජවෙල නිමාවන්හි පාවිච්චියෙන් පසු ඉවත ලන ලිපිගොනු, කඩදාසි, පත්තර, පොලිතීන්, ප්ලාස්ටික්, කාඩ්බෝඩ්, වීදුරු සහ වීදුරු බෝතල් ආදිය අලෙවි කිරීම | රු. 1000.00 | 2026. 01.09 දින සිට 2026. 01. 26 දින දක්වා 0900 පැයේ සිට 1400 පැය දක්වා | 2026.03.29 | රු. 10,000.00 සහ 2026.04.26 දින දක්වා වලංගු විය යුතුය | 2026. 01. 27 වන දින 1400 පැයට | ගබඩා කළමණාකාර සමඟ සාකච්ඡා කර වේලාවක් වෙන් කරවා ගැනීමෙනි දුරකථන අංක 0112572107 හෝ 0112572108 |

මේ සඳහා උනන්දුවක් දක්වන පාර්ශවයන් හට ටෙන්ඩර් ලිපිලේඛණ පරීක්‍ෂා කර බැලීම සඳහා සහ අවශ්‍ය තොරතුරු අප වෙබ් අඩවිය (www.cpstl.lk) මඟින් ඉහත කාලය තුලදි රාජකාරි දිනයන්හි 0900 පැය හා 1400 පැය අතර, කාලය තුලදි ඉහත සඳහන් ආපසු නොගෙවන ටෙන්ඩර් ලිපිලේඛණ ගාස්තුව ගෙවා අදාල රිසිට්පත සමඟ පහත ලිපිනය වෙත ලිඛිත ඉල්ලීමක් ඉදිරිපත් කිරීම මඟින් මුල් ටෙන්ඩර් ලිපිලේඛණ ලබාගත හැකිය.

තවද CPSTL ආයතනයේ බැංකු ගිණුමට මෙම මුදල බැරකර අදාල රිසිට්පත සමඟින් ප්‍රසම්පාදන කළමණාකාර වෙත ලිඛිත ඉල්ලීමක් procure@cpstl.lk වෙත විද්‍යුත් තැපැලෙන් එවීමෙන් ද CPSTL ගිණුමට ආපසු නොගෙවන ගාස්තුව ලැබුණු පසුව ලංසු ලේඛණ කට්ටලය ප්‍රසම්පාදන කාර්යාංශය මඟින් විද්‍යුත් තැපැලෙන් නිකුත් කරනු ඇත.

නිසි අයුරින් සම්පූර්ණ කර මුද්‍රා තබන ලද ලංසු අයදුම්පත් ලංසු භාරගන්නා අවසාන දිනය වන **2026.01.27** වන දින **14.00** පැයට පෙර පහත ලිපිනයට ලැබෙන සේ ලියාපදිංචි තැපැලෙන් හෝ ප්‍රධාන ගේට්ටුව අභියස ආරක්‍ෂක කාර්යාලයේ තබා ඇති ප්‍රසම්පාදන කාර්යාංශයේ ලංසු පෙට්ටියේ තැන්පත් කිරීමෙන් හෝ tenders@cpstl.lk විද්‍යුත් තැපැල වෙත ද ලංසු ඉදිරිපත් කල හැකිය.

මෙදින ඉහත වෙලාවටම එම ලංසු විවෘත කරනු ලබන අතර, එම වේලාව ඉක්මවා ගොස් ලැබෙන අයදුම්පත් ප්‍රතික්‍ෂේප කරන බව ද දන්වමි. ලංසු විවෘත කරන අවස්ථාව සඳහා අදාල ලංසුකරුට හෝ ඔහු විසින් ලිඛිතව නම්කරනු ලබන එක් අයකුට පමණක් සහභාගි විය හැකිය. වැඩි දුරටත් අවශ්‍ය විස්තර ලංසු පත්‍රිකාවේ සඳහන්ව ඇති අතර, පහත දුරකතන අංක මඟින් ද විමසිය හැකිය.

සභාපති,
සිලෝන් පෙට්‍රෝලියම් ස්ටෝරේජ් ටර්මිනල්ස් ලිමිටඩ්,
කළමණාකාර ප්‍රසම්පාදන
ප්‍රසම්පාදන කාර්යාලය,
පළමු මහල, නව ගොඩනැගිල්ල,
කොලොන්නාව.
වැල්ලම්පිටිය.
**011-2572156**

**සිලෝන් පෙට්‍රෝලියම් ස්ටෝරේජ් ටර්මිනල්ස් ලිමිටඩ් (CPSTL) පරිහරනයෙන් පසු ඉවතලන ලිපිගොනු, කඩදාසි, පත්තර, පොලිතින්, ප්ලාස්ටික්, කාඩ්බෝඩ්, විදුරු සහ විදුරු බෝතල් මිළදි ගැනිම සම්බන්ධයෙන් වන මූලික කොන්දේසි**

**අයදුම්කරුගේ නම** : ........................................................................

**ලිපිනය** : ........................................................................

**දුරකථන අංකය** : ........................................................................

**ඊ මේල් ලිපිනය (තිබේ නම්)** : ........................................................................

**දිනය** : ........................................................................

**ජාතික හැඳුනුම්පත් අංකය** : ........................................................................
(ජාතික හැඳුනුම්පතේ පිටපතක් ඇමිනිය යුතුය.)

1 කොලොන්නාව සිලෝන් පෙට්‍රෝලියම් ස්ටෝරේජ් ටර්මිනල්ස් ලිමිටඩ් (CPSTL) ආයතනයේ කොලොන්නාව සහ මුතුරාජවෙල නිමාවන්හි පරිහරනයෙන් පසු ඉවත්කරන ලද ඉහත ද්‍රව්‍යයන් අලෙවි කිරිම සඳහා මිළගණන් කැඳවීමට සුදානම් කර ඇත.

2 ඒවා පහත සඳහන් පරිදි අර්ථනිරූපණය වේ.

| | | |
|---|---|---|
| **ලිපිගොනු** | - | **ලිපිගොනු, ලිපිගොනු කවර,** |
| **කඩදාසි,** | - | **ඉරා හෝ පොඩිකරන ලද මුද්‍රිත වෙනත් ඉවත දමන කොල කඩදාසි** |
| **පත්තර** | - | **ආයතනයේ කියවීමෙන් පසු ඉවත් කරන ලද පුවත්පත්** |
| **පොලිතින්/ඉටිරෙදි** | - | **ෂොපින් බෑග්, ලන්ච් ෂීට්, පොලිතින් බෑග්, කෑබලි, ආයතනයේ පාවිච්චියෙන් පසු ඉවත් කරන ලද පොලිතින් සහ ඉටිරෙදි** |
| **ප්ලාස්ටික්** | - | **විවිධ ප්‍රමාණයේ ප්ලාස්ටික් බෝතල්, ප්ලාස්ටික් කෑන්, යෝගට් කප්, ප්ලාස්ටික් කෑම පෙට්ටි, වෙනත් ප්ලාස්ටික් උපාංග** |
| **කාඩ්බෝඩ්** | - | **විවිධ ප්‍රමාණයේ කාඩ්බෝඩ් පෙට්ටි ( නවන ලද සහ නැති )** |
| **විදුරු සහ විදුරු බෝතල්** | - | **විවිධ ප්‍රමාණයේ විදුරු සහ විදුරු බෝතල්** |

3 ටෙන්ඩර් පටිපාටියට අනුව තෝරාගත් ලංසුකරු/ලංසුකරුවන් වෙත ලංසු ප්‍රධානය කරනු ලබන දින සිට වර්ෂයක් සඳහා බල පැවැත්වෙන පරිදි එක් රැස්වන ප්‍රමාණයන් අනුව ගබඩා කාර්යාංශයෙන් දන්වන විට ඒවා රැගෙන යා යුතුය.

4 මෙම ද්‍රව්‍යයන් අයදුම්කරු විසින් CPSTL ආයතනයෙන් රැගෙන යාමේදි ආයතනයේ පවතින නීතිරීති වලට අනුකූලව, CPSTL ආයතනය විසින් නිර්දේශ කරන ආකාරයට රැගෙන යා යුතු අතර, මෙහිදි CPSTL දේපල උපකරණ වලට සිදුවන ඕනෑම හානියක් ලංසුකරු විසින් ඔවුන්ගේම වියදමින් සිදුකිරීමට/ප්‍රතිපූර්ණය කිරීමට හෝ CPSTL ආයතනය ලබා දෙන තක්සේරු කරන ලද අලාභය ගෙවිය යුතුය.

5 මෙම මිළදී ගැනීම මූලික ලංසු ක්‍රියාපටිපාටියට අනුව සිදුකරනු ලබන අතර, ලංසුකරුවන් එහි මූලික කොන්දේසි හා එකඟ වීමට බැඳී සිටිය යුතුය. අයදුම්පත සමඟ පහත සඳහන් තොරතුරු ඉදිරිපත් කලයුතු අතර, එසේ නොකර තිබීමෙන් අයදුම්පත ප්‍රතික්ෂේප වනු ඇත.

| | | |
|---|---|---|
| i. | මිළ ගණන් පත්‍රිකාව | ඇමුණුම් අංක 01 |
| ii. | දිවුරුම් ප්‍රකාශය | ඇමුණුම් අංක 02 |
| iii. | ජාතික හැඳුනුම්පතේ පිටපතක් | |
| iv. | අදාල ද්‍රව්‍ය කුමන කටයුත්තකට යොදා ගන්නේද යන්නත් කුමන ආකාරයකින් ප්‍රතිචක්‍රියකරණය කරන්නේද යන්න පිළබඳව ඇමුණුම් අංක 03 | |

6 අදාල මිළ ගණන් මේ සමඟ අමුණා ඇති **ඇමුණුම්** 1 පත්‍රිකාවේ අදාල ස්ථානයන්හි සඳහන් කල යුතු අතර, ලංසුකරු ගේ දිවුරුම් ප්‍රකාශය ද (**ඇමුණුම් 02**) අදාල තොරතුරු සඳහන් කර අත්සන් තබා තහවුරු කල යුතුය.

ලංසු බහාලන කවරයේ වම්පස ඉහළ කෙලවරේ **"KPR/16A/2025 පාවිච්චියෙන් පසු ඉවතලන ද්‍රව්‍යයන් මිළදී ගැනීම 2026.01.27"** යනුවෙන් සඳහන් කොට ලියාපදිංචි තැපෑලෙන් **2026.01.27** දින 14.00 පැයට පෙර ලැබෙන සේ, ප්‍රසම්පාදන කළමණාකාර, ප්‍රසම්පාදන කාර්යාංශය, සිලෝන් පෙට්‍රෝලියම් ස්ටෝරේජ් ටර්මිනල්ස් ලිමිටඩ්, පළමු මහල, නව ගොඩනැගිල්ල, කොලොන්නාව, වැල්ලම්පිටිය යන ලිපිනයට හෝ පැමිණ ප්‍රධාන ගේට්ටුව අභියස ආරක්ෂක කාර්යාලයේ තබා ඇති ප්‍රසම්පාදන කාර්යාංශයේ ලංසු පෙට්ටියට ද බහාලිය හැකිය. තවද tenders@cpstl.lk විද්‍යුත් තැපෑල ලිපිනය වෙත ද ලංසු ඉදිරිපත් කල හැකිය.

7 මෙම ටෙන්ඩරය සඳහා ආපසු ගෙවන රුපියල් **10,000.00** ක ටෙන්ඩර් ඇපකරයක් (Tender Security) තැබිය යුතු අතර, (ඇමුණුම් 5) එය **2026.04.26** දින දක්වා වලංගු විය යුතුය. ටෙන්ඩරයේ කටයුතු අවසන් කර සුදුසු ලංසුකරුවෙ වෙත වාර්ෂික ඇණවුම භාරදුන් වහාම මෙම ඇපකරය නිදහස් කරනු ලබන අතර, ටෙන්ඩරය හිමි වූ ලංසුකරු මෙම මුදල නිදහස් කරනු ලබන්නේ වර්ෂය පුරා එක්රැස් වන ද්‍රව්‍ය නිසි ලෙස රැගෙන යාමෙන් අනතුරුවය. ආයතනය දන්වන විටෙක එක්රැස් වන ද්‍රව්‍ය නිසි ලෙස රැගෙන නොයන්නේ නම් ලංසුකරු තැන්පත් කර ඇති මෙම මුදල අප ආයතනය සතු වන්නේය.

8 අයදුම්පත් **භාර ගැනීම 2026.01.27 දින ප.ව. 2.00** දක්වා පමණක් වලංගු වන අතර, එම වේලාවේදී ම ලංසුපත් විවෘත කිරීමට කටයුතු කරනු ලැබේ. ලංසු විවෘත කිරීමෙන් පසුව ලැබෙන ලංසු ප්‍රතික්ෂේප කෙරන අතර, මෙහිදී ලංසුකරුට හෝ ඔහුගේ අනුමැතිය ලත් එක් නියෝජිතයෙකුට පමණක් ලංසු විවෘත කිරීමේ අවස්ථාවට සහභාගී වීමට අවසර ලැබෙනු ඇත. ලංසු විවෘත කිරීමෙන් පසුව ලැබෙන කිසිදු පැමිණිල්ලක් සලකා නොබලන අතර, අදාල කොන්දේසි හා නීතිරීති සඳහා සෑහිමකට පත්වන්නේ නම් පමණක් ලංසු ඉදිරිපත් කරන ලෙසද දන්වමි.

9 ලංසු ඉල්ලුම්පත් නිකුත් කරන කාලය තුළ සියළුම ඉල්ලුම්කරුවන් සඳහා මෙම ඉවතලන ද්‍රව්‍යවල නියැදි පරීක්ෂා කිරීමට අවසරය ලබාදෙන අතර, දුරකථන අංක 0112572107 හෝ 0112572108 අමතා දිනයක් වේලාවක් වෙන්කර ගැනීමෙන් පමණක් ඉහත සඳහන් ද්‍රව්‍යයන් පරීක්ෂා කල හැකිය.

10 තොරා ගන්නා ලංසුකරුවන් වෙත ලිඛිතව දැනුම්දෙනු ලබන අතර, එම ලිපියේ දින සිට සතියේ වැඩකරන දින 14 ක් තුල (CPSTL) ආයතනය හා ලංසුකරු අතර මූලික එකඟතා ගිවිසුමකට අත්සන් ලැබිය යුතු අතර, **(ඇමුණුම් 04)** ලංසුකරු විසින් ඉදිරිපත් කර ඇති මිළ ගණන් වලට අදාල මුළු වටිනාකමෙන් 10% ක මුදලක් කාර්ය සාධන ඇපකරයක් ලෙස (Perpormance Bond) CPSTL ආයතනයේ තැන්පත් කල යුතුය. ඉන් අනතුරුව අදාල තොග මිණුම් කටයුතු සඳහා භාජනය කර මුදල් එවෙලේ ම ගෙවා රිසිට්පත් ගබඩා කාර්යාංශය සහ ආරක්ෂක කාර්යාංශය වෙත ඉදිරිපත් කිරීමෙන් අනතුරුව රැගෙන යා හැකිය. වර්ෂය පුරා එක්රැස් වන ද්‍රව්‍ය නිසි ලෙස රැගෙන නොයන්නේ නම් ටෙන්ඩර්කරු විටෙන් විට තැන්පත් කර ඇති මෙම මුදල් අප ආයතනය සතු වන්නේය. ඒ සඳහා පෙර දැනුම්දීම් අවශ්‍ය නොවන්නේය.

11 මෙම **ලංසුවේ වලංගුකාලය 2026.03.29** දින දක්වා වන අතර, **අදාල මිළ ගණන්** මෙම ලංසුව ප්‍රධානය කරන දින සිට වර්ෂයක් දක්වා වලංගු වන්නේය.

12 ඉදිරිපත් කර ඇති මිළ ගණන් තාක්ෂණික ඇගයීම් කමිටුව වෙත යොමුකර මූලික සුදුසුකම් සපුරා ඇති අයදුම්කරුවන්ගෙන් ඒ ඒ ද්‍රව්‍ය සඳහා වැඩි ම ලංසු ඉදිරිපත් කර ඇති ද්‍රව්‍යයට හෝ ද්‍රව්‍යයන් සඳහා තේරිපත්ව ඇති ලංසුකරුවන් වෙත දැනුම් දෙනු ලබන අතර, එසේ දැනුම් දි දින 14 ක් ඇතුලත එම ද්‍රව්‍යවල මුළු ප්‍රමාණය ම නියමිත වටිනාකම ගෙවා රැගෙන යාමට කටයුතු කල යුතුය. කිසිඳු ද්‍රව්‍යයක් හෝ කොටසක් ඉතිරි නොකල යුතු අතර, වර්ෂය පුරා එසේ ඉතිරිව හෝ රැගෙන යාමට අපොහෙසත් වන ලංසුකරුවන්ගේ ඉහත අංක 07 සහ 10 සඳහන් පරිදි තැන්පත් කරන බැදුම්කර අප ආයතනය සතුවන වන බවද දන්වමි.

13 ප්‍රවාහනය කරන සියළු ද්‍රව්‍ය ආවරනය වන වාහනයක විධිමත් ආකාරයට රැගෙන යා යුතුය.

14 ලංසුව සඳහා තේරිපත් ව තිබියදි හෝ භාණ්ඩ රැගෙන යාමට සුදානම් කර තිබියදි හෝ බැඳුම්කරය හෝ ගෙවන ලද මුදල් කුමන හේතුවක් මත හෝ ආපසු ලංසුකරු විසින් ඉල්ලා සිටිය ද ඒවා ලබා දීමට CPSTL ආයතනය බැදි නොමැති බව දන්වමි.

15 භාණ්ඩ මිළදි ගැනීමට තේරිපත් වූ ලංසුකරුවන්ගේ ඉහත බැඳුම්කර මුදල් නිදහස් කරනු ලබන්නේ වර්ෂය පුරා එක්රැස් වන සියළු භාණ්ඩ රැගෙන ගොස් අවසන් වූවායින් පසුව වන අතර, තේරිපත් නොවු ලංසුකරුවන්ගේ බැඳුම්කර තෝරාගත් ලංසුකරු වෙත කොන්ත්‍රාත්තුව පිරිනැමීමෙන් පසුව නිදහස් කරනු ඇත.

16 සියළු මූල්‍ය ගණුදෙනු සඳහා VAT ඇතුලත් වේ. ලංසුකරු විසින් සඳහන් කරන මිළ ගණන් සඳහා 18**% ක VAT සමඟ මිළ ගණන්** සඳහන් කල යුතුය.

17 ඔබ විසින් රැගෙන යන ලිපිගොනු කඩදාසි, ආදිය ආයතනයේ විවිධ රාජකාරි කටයුතු සඳහා යොදා ගත් ඒවා බැවින් ඒවා රැගෙන යාමේදි මනා පරිදි ආවරණය සහිතව රැගෙන යා යුතුය. තවද මේවා මනා අරක්ෂිත ක්‍රමවේද යටතේ ප්‍රතිචක්‍රීයකරණය කලයුතු අතර, CPSTL ආයතනයට මේ තුලින් මොනම ආකාරයක හෝ අගතියක් බලපෑමක් වෙනත් ගැටළුවක් නොවීමට ලංසුකරු විසින් වගබලා ගත යුතුය.

18 තවද ඔබ විසින් රැගෙන යන මෙම ලිපිගොනු කඩදාසි, පත්තර, පොලිතීන්, බෝතල් හා කාඩ්බෝඩ් ආදිය කුමන කටයුත්තකට යොදා ගන්නේද ? කුමන ආකාරයකින් ප්‍රතිචක්‍රීයකරණය කරන්නේද? යන්න පිළිබඳව ඇමුණුම් 3 හි සටහන් කල යුතුය.

19 මෙම මිළදි ගැනීම සම්බන්ධයෙන් ලංසුකරු තේරිමේ බලය හෝ අවස්ථානුරූපීව නැවත මිල ගණන් කැදවීමට අවසාන තීන්දු ගැනීමේ සම්පූර්ණ බලය CPSTL ආයතනය සතුවන අතර, ගනු ලබන තීරණ අවසාන තීරණය වන බවත් ඊට එකඟ වීමට ලංසුකරු බැදී සිටිය යුතුය.

20 CPSTL ආයතනය සහ ලංසුකරු යන පාර්ශව දෙකටම මසකට පෙර ලිඛිතව කල්තියා දැනුම් දීමෙන් පසු මෙම ගිවිසුම හෙවත් මෙහි අඩංගු කරුණක් හෝ කීපයක් වෙනුවෙන් හෝ ගනුදෙනුවෙන් ඉවත් වීමට ඉල්ලීම් කල හැකිය. ඒ සඳහා මෙහිදි පාර්ශව දෙකටම අන්‍යෝන්‍ය වශයෙන් පිලිගත හැකි හා එකඟ විය හැකි හේතුවක් විය යුතු අතර, ඊට අදාල අවශ්‍ය තීන්දුවකට ඒකමතිකව එළබීමට **CPSTL** ආයතනයට බලය ඇත.

**සිලෝන් පෙට්‍රෝලියම් ස්ටෝරේජ් ටර්මිනල්ස් ලිමිටඩ්**
**ප්‍රසම්පාදන කළමණාකාර**

DRAFT

ඇමිණුම් 01

# සිලෝන් පෙට්‍රෝලියම් ස්ටෝරේජ් ටර්මිනල්ස් ලිමිටඩ් (CPSTL )

## ඉවතලන ලිපිගොනු, කඩදාසි, පත්තර, පොලිතින්, ප්ලාස්ටික්, කාඩ්බෝඩ්, විදුරු හා විදුරු බෝතල් මිළදි ගැනිම සඳහා ඉදිරිපත් කරනු ලබන ටෙන්ඩර් අයදුම්පත

## මිළ ගණන් පත්‍රිකාව

| අඅ | වර්ගය | කි.ග්‍රෑ. 1 ක ගැනුම් මිළ රු. (18% බදු සහිතව) |
|---|---|---|
| 1 | ලිපි ගොනු | |
| 2 | කඩදාසි | |
| 3 | පත්තර | |
| 4 | කාඩ්බෝඩ් | |
| 5 | ප්ලාස්ටික් | |
| 6 | පොලිතින් | |
| 7 | විදුරු | |
| 8 | විදුරු බෝතල් | |

ලංසුකරුගේ නම :.................................

වැට් අංකය :.................................

(අදාල නම් පමණක්)

ලිපිනය :.................................

.................................

.................................

දුරකතන අංකය :.................................

ඊ මේල් :.................................

ලන්සුකරුගේ අත්සන :.................................

දිනය :.................................

මුද්‍රාව :.................................

හැදුනුම්පත් අංකය :.................................

DRAFT

**බැඳියාවන් පිළිබඳ ඝට්ටනයන් නොමැති බවට ඉදිරිපත් කරනු ලබන දිවුරුම් ප්‍රකාශය**

**පාවිච්චියෙන් පසු ඉවතලන ලිපිගොනු, කඩදාසි, පත්තර, පොලිතින්, ප්ලාස්ටික්, කාඩ්බෝඩ්, විදුරු සහ විදුරු**

**බෝතල් ආදිය අලෙවි කිරීම සඳහා ලංසු කැඳවීම 2026- KPR/16A/2025**

ඉහත ටෙන්ඩරයේ ටෙන්ඩර්කරු/නියෝජිතයා ලෙස .................................................................................................. පදිංචි ........................................................................................ වන මම (ජාතික හැඳුනුම්පත් අංකය ……………………..) සත්‍ය ලෙසත්, අවංක ලෙසත්, ප්‍රතිඥා දී/ දිවුරා පහත සඳහන් ප්‍රකාශයන් කරමි.

අ) මා නියෝජනය කරන ආයතනයේ, සමාගමේ, සංස්ථාවේ හෝ හවුලේ හෝ වෙනත් කිසිදු පුද්ගලයෙකු හෝ නියෝජිතයකු මෙම ටෙන්ඩරයට අදාලව මා විසින් ඉදිරිපත් කරනු ලබන මිළ ගණන් සම්බන්ධයෙන් කිසිදු පුද්ගලයකු සමඟ කිසිදු එකතුවක් හෝ සහයෝගිතාවයක්, සම්බන්ධටාවයක් ඒ සමාන කිසිදු ගිවිසුමක් නැති බවත්,

ආ) මා හෝ මා නියෝජනය කරන කිසිදු අයකු විසින් කිනම් හෝ පුද්ගලයකු මෙම ටෙන්ඩරයට ඉදිරිපත්වීම වැලැක්වීමට, වැලකි සිටීමට හෝ පෙළඹවීමට කිසිදු ආකාරයක පියවරයන් ගෙන නොමැත් බවත්,

සහ

ඇ) මෙම ටෙන්ඩරය වෙනත් කිසිදු ටෙන්ඩරයක් සම්බන්ධයෙන් සහ මෙම ටෙන්ඩරයට අදාලව වෙනත් කිසිදු පුද්ගලයකු සමඟ හෝ යම් එකඟතාවයක් අවබෝධයක් හෝ සංයෝජනයක් නොමැතිව ඉදිරිපත්කර ඇති බවත්,

මෙම ටෙන්ඩරය ඉදිරිපත් කිරීම සම්බන්ධයෙන් කිසිදු පුද්ගලයෙකුට, සමාගමකට, සංස්ථාවකට සෘජුව හෝ වක්‍රව කිසිදු වට්ටමක්, ගාස්තුවක්, තෑග්ගක්, කොමිස් මුදලක්, හෝ යම් වටිනා දෙයක් ලැබී නොමැති බව හෝ නොලැබෙන බව ද මා තව දුරටත් ප්‍රකාශ කරමි.
මේ සම්බන්ධව කිසිදු ආකාරයක කුමන්ත්‍රණයක් නොමැති බව සහතික කිරීම සඳහා මා සම්පූර්ණ වගකීම භාරගන්නා අතර, මීට අදාල ටෙන්ඩර් ක්‍රියාවලිය පුරාම සාධාරණ සහ සදාචාරාත්මක තරඟකාරී පිලිවෙතක් අනුගමනය කිරීමට සහ අදාල ප්‍රසම්පාදන මාර්ගෝපදේශ වලට සම්පූර්ණයෙන්ම අනුකූල වීමට මෙයින් පොරොන්දු වෙමි.
මෙම දිවුරුම් ප්‍රකාශයේ මා විසින් කරන ලද සියළුම ප්‍රකාශ සත්‍ය හා නිවරදි බවත්, බොරු සාක්ෂි සඳහා වන දඬුවම් වලට මා එකඟ වන බවත්, මෙයින් සහතික කරමි.

ඉහත සඳහන් දිවුරුම් ප්‍රකාශය, මෙහි සිද්ධි ප්‍රකාශක
වන ................................................................................ නැමැති
සහතික කරන්නා හට නිසි ලෙස කියවා පැහැදිලි කරදී
ඇති අතර, ඔහු/ඇය එහි අන්තර්ගතය තේරුම් ගෙන
නිවරදි බව පිළිගෙන ඔහුගේ/ඇයගේ අත්සන මා
ඉදිරියේදි 2025 ......... මස ......... දින තබන ලදි.

……………………………
මා ඉදිරිපිටදිය

…………………………
සාමදාන විනිශ්වයකාර/දිවුරුම් කොමසාරිස්

නිල මුද්‍රාව



DRAFT

1 ඔබ විසින් රැගෙන යන ලිපිගොනු සහ කඩදාසි, පත්තර, පොලිතින් සහ ප්ලාස්ටික්, කාඩ්බෝඩ් හා වීදුරු බෝතල් ආදිය කුමන කටයුත්තකට යොදා ගන්නේද? කුමන ආකාරයකින් ප්‍රතිචක්‍රීයකරණය කරන්නේද? යන්න පිළිබඳව විස්තරයක් කරන්න.

දිනය : ....................................

අත්සන : ....................................

මුද්‍රාව : ....................................

DRAFT

# ගිවිසුම

## සිලෝන් පෙට්‍රෝලියම් ස්ටෝරේජ් ටර්මිනල්ස් ලිමිටඩ් හි පරිහරනයෙන් පසු ඉවතලන ලිපිගොනු, කඩදාසි, පත්තර, පොලිතින්, ප්ලාස්ටික්, කාඩ්බෝඩ්, විදුරු සහ විදුරු බෝතල් ආදිය මිළදි ගැනිම සම්බන්ධයෙන් ඇතිකර ගනුලබන ගිවිසුම KPR/16A/2025

මෙහි පහත **දිමණාකාර සමාගම** යනුවෙන් හඳුන්වනු ලබන වැල්ලම්පිටිය, කොළොන්නාව ප්‍රධාන ව්‍යාපාරික ස්ථානය පවත්වාගෙන යනු ලබන 1982 අංක 17 දරණ සහ 2007 අංක 07 දරණ සමාගම පනත් යටතේ සහ 1987 අංක 23 දරණ සංස්ථා හෝ ආණ්ඩුවට අයත් ව්‍යාපාර ආයතන පොදු සමාගම් බවට පරිවර්ථනය කිරීමේ පනතේ ප්‍රතිපාදන යටතේ සමාගමක් වශයෙන් සංස්ථාපනය කරන ලද සහ අංක 310/8 සහ 2003.10.13 දින දරණ ගැසට් නිවේදනය මඟින් ලංකා ඛනිජතෙල් නීතිගත සංස්ථාව සතුව තිබූ ඉන්ධන රැස්කිරීමේ හා බෙදාහැරීමේ කාර්යයන් පවරා ගනුලැබූ **සිලෝන් පෙට්‍රෝලියම් ස්ටෝරේජ් ටර්මිනල්ස් ලිමිටඩ් (CPSTL) පළමු පක්‍ෂය** ලෙස ද,

සහ

මෙහි පහත **ගැණුම්කරු** යැයි හඳුන්වනු ලබන, ................................................................................ **පදිංචි,** ................................................................................ යන අය **දෙවන පක්‍ෂය ලෙස ද**, බැඳි එකි දිමණාකාර සමාගමට අයත් කොලොන්නාව සහ මුතුරාජවෙල නිමාවන්හි පරිහරනයෙන් පසු ඉවතලන ලිපිගොනු, කඩදාසි, පත්තර, පොලිතින්, ප්ලාස්ටික්, කාඩ්බෝඩ්, විදුරු සහ විදුරු බෝතල් ආදිය මිළදි ගැනිම සම්බන්ධයෙන් පහත සඳහන් පිළිගැනිම් හා කොන්දේසි වලට එකඟ වෙමින් ඇතිකර ගනු ලබන ගිවිසුමයි.

එකි ගිවිසුමේ කොන්දේසි හා පිළිගැනිම් කවරේද යත්,

1. මෙම ගිවිසුමේ දිමණාකාර සමාගමට අයත් කොලොන්නාව සහ මුතුරාජවෙල නිමාවන්හි පරිහරනයෙන් පසු ඉවත දමන ලිපිගොනු, කඩදාසි, පත්තර, පොලිතින්, ප්ලාස්ටික්, කාඩ්බෝඩ්, විදුරු සහ විදුරු බෝතල් ආදිය ................................ **දින සිට** ................................ දින දක්වා වර්ෂයක කාලයකට එක් රැස්වන ප්‍රමාණයන් අනුව ගබඩා කාර්‍යාංශයෙන් දන්වන විට ඒවා රැගෙන යාමට දෙවන පක්‍ෂයට අවසර දෙනු ලැබේ. මේ සඳහා ලබා ගන්නා මිළ ගණන් ලංසු ප්‍රධානය කරන දින සිට ඉහත කී කාලය සඳහා නොවෙනස්ව බල පැවැත්විය යුතුය.

2. මෙම ද්‍රව්‍යයන් අයදුම්කරු විසින් CPSTL ආයතනයෙන් රැගෙන යාමේදි ආයතනයේ පවතින නීතිරීති වලට අනුකූලව, CPSTL ආයතනය නිර්දේශ කරන ආකාරයට රැගෙන යායුතු අතර, CPSTL හි ඇති දේපල උපකරණ වලට සිදුවන ඕනෑම හානියක් ඔවුන්ගේම වියදමින් සිදුකිරීමට හෝ CPSTL ආයතනය ලබා දෙන තක්සේරු කරන ලද අලාභය ගෙවීමට එකඟ විය යුතුය.

3. සෑම බිල්පතකම මුළු වටිනාකමෙන් 10% ක මුදලක් කාර්ය සාධන ඇපකරයක් ලෙස (Perpormance Bond) CPSTL ආයතනයේ තැන්පත් කල යුතු අතර, ඉන් අනතුරුව අදාල තොග මිණුම් කටයුතු සඳහා භාජනය කර මුදල් එවෙලේ ම ගෙවා රිසිට්පත් ගබඩා කාර්යාංශය සහ ආරක්‍ෂක කාර්යාංශය වෙත ඉදිරිපත් කිරීමෙන් අනතුරුව රැගෙන යා හැකිය.

4. ලංසුවෙන් තේරිපත්ව ඇති කිසිඳු ද්‍රව්‍යයක් හෝ කොටසක් ඉතිරි නොකල යුතු අතර, වර්ෂය පුරා එසේ ඉතිරිව හෝ රැගෙන යාමට අපොහොසත් වන ලංසුකරුවන්ගේ තැන්පත් කරන බැදුම්කර අහිමි වන බවද දනිමි.

5. ප්‍රවාහනය කරන සියළු ද්‍රව්‍ය ආවරනය සහිත වාහනයක ම රැගෙන යාමට එකඟ වේ.

6. ලංසුව සඳහා තේරිපත් ව තිබියදි හෝ භාණ්ඩ රැගෙන යාමට සුදානම් කර තිබියදි හෝ බැඳුම්කරය හෝ ගෙවන ලද මුදල් කුමන හේතුවක් මත හෝ ආපසු ලන්සුකරු විසින් ඉල්ලා සිටිය ද ඒවා ලබා දිමට CPSTL ආයතනය බැදි නොමැති බව පිලිගනිමි.

7. භාණ්ඩ මිළදි ගැනීමට තේරිපත් වු ලන්සුකරුවන්ගේ ඉහත බැඳුම්කර මුදල් නිදහස් කරනු ලබන්නේ වර්ෂය පුරා එක්රැස් වන සියළු භාණ්ඩ රැගෙන ගොස් අවසන් වුවායින් පසුව වේ.

8. ගැණුම්කරු විසින් රැගෙන යන ලිපිගොනු කඩදාසි, ආදිය ආයතනයේ විවිධ රාජකාරි කටයුතු සඳහා යොදා ගත් ඒවා බැවින් ඒවා රැගෙන යාමේදි මනා පරිදි ආවරණය සහිතව රැගෙන යා යුතුය. තවද මේවා මනා අරක්‍ෂිත ක්‍රමවේද යටතේ ප්‍රතිචක්‍රියකරණය කලයුතු අතර, CPSTL ආයතනයට මේ තුලින් මොනම ආකාරයක හෝ අගතියක් බලපෑමක් වෙනත් ගැටළුවක් නොවීමට ලංසුකරු විසින් වගබලා ගත යුතුය.

9. පාර්ශව දෙකටම මසකට පෙර ලිඛිතව කල්තියා දැනුම් දීමෙන් පසු මෙම ගිවිසුම හෙවත් මෙහි අඩංගු කරුණක් හෝ කිපයක් වෙනුවෙන් ඉල්ලීම් කල හැකිය. ඒ සඳහා මෙහිදි පාර්ශව දෙකටම අන්‍යෝන්‍ය වශයෙන් පිලිගත හැකි හා එකඟ විය හැකි හේතුවක් විය යුතු අතර, ඊට අදාල අවශ්‍ය තින්දුවකට ඒකමතිකව එළබීමට **CPSTL** ආයතනයට බලය ඇත.

10. මෙම ගිවිසුමට අදාළ ගැණුම්කාර පාර්ශවය විසින් ම මෙම භාණ්ඩ රැගෙන යා යුතුය. කුමන හේතුවක් මත හෝ ගැණුම්කරු විසින් **වෙනත් පුද්ගලයෙකුට හෝ පාර්ශවයකට පැවරීම නොකළ යුතුය**.

11. මෙම ගිවිසුමට අදාල ලංසු පත්‍රිකාවේ සඳහන් වී ඇති කොන්දේසි කඩවීමක් සිදුවුව හොත්, හෝ වර්ෂය පුරා ඉහත ද්‍රව්‍ය රැගෙනයාමට තේරිපත්ව තිබියදි ඒවා මුදල් ගෙවා රැගෙන නොයැම හෝ ආදි කටයුත්තකදි ඒ පිළිබඳව පරීක්ෂණයක් පවත්වා ඒ බව ඔප්පු වුවහොත් ඕනෑම වේලාවක ඔබගේ ලංසුව සහ ඔබ විසින් තැන්පත් කර ඇති සියළු ඇප තැන්පතු අප ආයතනයට අත්පත් කර ගැනිමට කටයුතු කිරීමට දීමණාකාර පාර්ශවයට බලය ඇත.

12. මෙම ගිවිසුම සම්බන්ධයෙන් ඇති වන සියළුම ප්‍රශ්න හා ගැටළු දීමණාකාර CPSTL ආයතනයේ ප්‍රසම්පාදන කළමණාකාර වෙත ඉදිරිපත් කළයුතු අතර, එකී ප්‍රශ්න හෝ ගැටළු සම්බන්ධයෙන් සම්පාදන කමිටුවේ සභාපති විසින් ගනුලබන තිරණ අවසාන තිරණ වේ.

ඉහත සඳහන් පිළිගැනීම හා කොන්දේසි වලට එකඟ වෙමින් දෙපාර්ශවය විසින් 2026................ වන දින කොළඹදි අත්සන් තබන ලදි.

**පළමු පාර්ශවය** **දෙවන පාර්ශවය**

සාක්ෂිකරුවන්

නම : නම :

ලිපිනය : ලිපිනය :

අත්සන : අත්සන :

# FORM OF TENDER SECURITY

**TENDER NUMBER: KPR/ 16A/2025**

**DATE: …………………….**

**SUM GUARANTEED: LKR 10,000.00**

**BENEFICIARY: CEYLON PETROLEUM STORAGE TERMINALS LIMITED**

## SALE OF WASTE PAPER, WASTE FILE, POLYTHINE, CARDBOARDS, AND GLASS BOTTLE AT CPSTL FOR 2026 KPR/16A/2025

Dear Sir,

By this Bond we ……………………………………………………….................................. (hereinafter called "the Tenderer") and we ……………………………………………………………………(name of Bank) whose registered office is at ……………………………………………………………………………………….(hereinafter called "the Surety") are held and firmly bound into ……………………………………………………………(hereinafter called "the Authority") in the sum of ……………………………………..for the payment of which sum the Tenderer and the Surety bind themselves their successors and assigns jointly and severally by these present.

Whereas the Authority has invited the Tenderer and other persons to complete Tenders in similar terms for the supply of ……………………………….…………………………………………and works associated (hereinafter called "the Tender") in accordance with such invitation, the Bond shall provide security to the Authority that the Tenderer will honor certain obligations to be undertaken by him in the Tender in accordance with the following conditions.

Now the Conditions of this Bond are:

(a) that it shall remain in full force and effect until the earliest of

from **27.01.2026** up to **29.03.2026**, the date stipulated by the Authority for the submission of Tenders, or any prolongation of such date above notified to the Authority by the Tenderer and the Surety in writing:

Subject to this Tender being in full force and effect, the Surety shall pay the full amount specified in this Bond upon receipt of first written demand from the Authority stating that

I. the Tenderer has withdrawn his Tender during the Tendering period, or

II. the Tenderer has failed to satisfactory removal of the vehicle in accordance with the terms of the contract between them upon acceptance of the Tender.

No alteration in the terms of the Tender, nor any forbearance or forgiveness in or in respect of any matter or thing concerning the Tender on the part of the Authority, nor any objection from the Tenderer shall in any way release the Surety from any liability under this Bond.

Cont…

The benefit of this Bond shall not be assignable by the Authority and upon its ceasing to be in full force and effect the Authority shall return the same to the Tenderer.

This Bond shall be governed by the laws of Sri Lanka.

I This document is executed as a Date on this (     ) day of (   )2026 (    )

For and on behalf of the Tenderer………………for and on behalf of the Surety…………

..……………………………………………………………………………………........

Signed by…………………………………Signed by…………………………………….

In the capacity of ………………………      In the capacity of ……………………………

And by……………………………………      And by………………………………………..

In the capacity of…………………………In the capacity of …………………………….

DRAFT